5 ගනුදෙනු සටහන් කිරීමේ මූලික පොතක් ලෙස මුදල් පොත

මෙම පරිච්ඡේදය මගින් පහත දැක්වෙන තේමා පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

5.1 මුදලින් සිදුවන ගනුදෙනු වාර්තා කිරීම

5.2 තනි තීරු සහ ද්විත්ව තීරු මුදල් පොත

5.3 බැංකු සැසඳුම් ප්‍රකාශය

මුදල් පොතක ගනුදෙනු නිසි ලෙස පවත්වා ගනිමු

වාණිජ අංශයේ ඉගෙනුම ලැබූ සඳමාලි අලුත් පලතුරු මිලට ගෙන නැවත විකිණීම සඳහා ව්‍යාපාර ක්ෂේත්‍රයට පිවිසියා ය. ඇයට තම පාසල් මිතුරකු වූ වෘත්තියෙන් ගණකාධිකාරිවරයෙකු වූ වැලිඅරාව මහතා මුණ ගැසිණි. දෙදෙනා අතර ඇති වූ සාකච්ඡාවේ කොටසක් පහත දැක්වේ.

සඳමාලි : ආයුබෝවන් ! කාලයකට පස්සේ, කොහොම ද? අලුත් තොරතුරු එහෙම...

වැලිඅරාව : බොහොම හොඳයි. එතකොට ඔබ?

සඳමාලි : දැන් අලුත් පලතුරුවලට හොඳ ඉල්ලුමක් පවතිනවානේ. මම තීරණය කළා ව්‍යාපාරයක් පොඩියට පටන් ගෙන ඉදිරියට ගෙනියන්න. ඉතින් ඔබගේ සහයෝගයත් මට වැදගත් වේවි.

වැලිඅරාව : ඇත්තෙන් ම ඔව්, ව්‍යාපාරයක් කරගෙන යනවිට මතක තබා ගන්න ඕන වැදගත් ම දේ තමයි හැම ගනුදෙනුවක් පිළිබඳව ම වාර්තා තබාගන්න එක. එය පහසුයි. ඊටත් වඩා හරිම වැදගත්.

සඳමාලි : හැම එකක් ම අත්පිට මුදලට ම කරන්නත් අමාරුයි. ණයටත් ගනුදෙනු කරන්න වෙනවා.

වැලිඅරාව : අත්පිට කළත්, ණයට කළත් එම ගනුදෙනුවලට අදාළ ලදුපත්, ගෙවීම් වවුචර, ඉන්වොයිසි ආදී ලිපි ලේඛන පාවිච්චි කරන්න වෙනවා. ඒවායේ ගනුදෙනුවලට අදාළ තොරතුරු පවතින නිසා ගිණුම් වාර්තා තබා ගන්න එක පහසුයි.

සඳමාලි : එතකොට චෙක්පත්වලින් ගනුදෙනු කරන්න වුනොත් !

වැලිඅරාව : වඩාත් හොඳ ප්‍රශ්නයක්. ජංගම ගිණුමක් විවෘත කරන්න. එතකොට බැංකුවෙන් චෙක් පොතක් ලැබේවි. ගෙවීම් කරන විට චෙක්පත් නිකුත් කරන්න පුළුවන්. ලැබෙන චෙක්පත් බැංකුවේ තැන්පත් කරන්න පුළුවන්. බැංකුවත් එක්ක විශ්වාසය තබා ගත්තම බොහෝ වාසි ප්‍රයෝජන ගන්න පුළුවන්.

සඳමාලි : මට පුළුවන් මුදල්වලින් හා චෙක්පත්වලින් කරන ගනුදෙනු ටික මුදල් පොතක සටහන් කරන්න. ඒත්, ඒකට අමතර කාලයක්, වෙහෙසක් දරන්න වෙනවානේ...

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

වැලිඅරාච	:	එහෙම හිතන්න එපා. මුදලින් කරන ගනුදෙනු නිවැරදි ව මුදල් පොතේ වාර්තා කරනවා. බැංකුවෙනුත් 'බැංකු ප්‍රකාශනයක්' එවනවා නේ.
සඳමාලි	:	ඒක මට එච්චර ම පැහැදිලි නෑ. තව ටිකක් විස්තර කළොත් ?
වැලිඅරාච	:	හොඳයි, මම පැහැදිලි කරල දෙන්නම්. ඔබ, ඔබේ මුදල් පොතේ, මුදල්වලින් හා චෙක්පත්වලින් කරන ගනුදෙනු සටහන් කරනවා වගේම, බැංකුවත් ඔබේ ජංගම ගිණුම සමග සිදු කෙරෙන ගනුදෙනු සටහන් කරනවා. පස්සේ 'බැංකු ප්‍රකාශය' ලෙස වාර්තාවක් ව්‍යාපාරයට සපයනවා. බැංකු ප්‍රකාශයේ තිබෙන තොරතුරු අපේ මුදල් පොතේ බැංකුවත් එක්ක කළ ගනුදෙනු සමග සසඳා බලා ඒවායේ හරි වැරදි අපට ම බලා ගන්න පුළුවන්. බැංකු සැසඳුම් විස්තරයක් පිළියෙල කරල ශේෂයන්ගේ නිවැරදිතාවය තහවුරු කර ගත්තම හරි.
සඳමාලි	:	ඔබගේ උපදේශ මට ඉතාමත් වැදගත් වේවි. වැලිඅරාච මහත්මයා... බොහෝම ස්තූතියි !

ඉහත සඳහන් දෙබස කියවූ ඔබට ව්‍යාපාර ගනුදෙනු සටහන් කිරීමේ අවශ්‍යතාව ගැන විවිධ අදහස් පැන නැගෙන්නට ඇත. මේ පිළිබඳ වැඩි අවබෝධයක් ලබා ගැනීම සඳහා ගනුදෙනු මුදල් පොතක සටහන් කරන ආකාරය තව දුරටත් විමසා බැලීම වැදගත් වේ.

හැඳින්වීම

ව්‍යාපාරික ගනුදෙනු සිදුවන විට විවිධ මූලාශ්‍ර ලේඛන බිහි වේ. එම මූලාශ්‍ර ලේඛන පදනම් කරගනිමින් ප්‍රථම වරට ගනුදෙනු වාර්තා කරන පොත්, මූලික සටහන් පොත් වේ. මුදල් පොත ද එක් මූලික සටහන් පොතකි. එය සුවිශේෂ වැදගත්කමකින් යුක්ත වූවකි.

මුදල් ගනුදෙනු සිදුවන විට බිහිවෙන මූලාශ්‍ර ලේඛන පදනම් කර ගනිමින් ප්‍රථම වරට මුදල් පොතක ගනුදෙනු වාර්තා කෙරේ. මෙහි ගනුදෙනු වාර්තා කිරීමේ දී ඊට ගැළපෙන ආකාරයෙන් මුදල් පොත සකසා ගැනීම සිදු කළ හැකි ය.

මුදල් පොතක ගනුදෙනු වාර්තා කිරීම සිදුවන්නේ වත්කම්වලට අදාළ ද්විත්ව සටහන් මූලධර්මයට අනුව ය. එලෙස වාර්තා කළ ගනුදෙනු ද්විත්ව සටහන් න්‍යායට අනුව ඒවාට අදාළ අනෙකුත් ලෙජර ගිණුම්වලට පිටපත් කෙරේ.

ව්‍යාපාරයේ ජංගම ගිණුම සමග සිදුකළ ගනුදෙනු ඇතුළත් කොට වාණිජ බැංකුව විසින් ව්‍යාපාරයට වාර්තාවක් එවනු ලබයි. එය බැංකු ප්‍රකාශය හෙවත් බැංකු ගිණුම් විස්තරය වේ. මුදල් පොතේ බැංකු තීරු සමග බැංකු ප්‍රකාශයේ තීරු සැසඳීමෙන් බැංකු ශේෂයන්ගේ වෙනසක් ඇතිවීමට තුඩුදුන් හේතු අනාවරණය කරගත හැකි වේ. ඒ අනුව බැංකු ශේෂවල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කෙරේ.

මෙම පරිච්ඡේදයේ දී පහත සඳහන් මූලික යෙදුම් කෙරෙහි අවධානය යොමු කෙරේ.

- මූලාශ්‍ර ලේඛන
- මූලික පොත්
- මුදල් පොත
- ලෙජර සටහන්
- මුදල් හා බැංකු ශේෂ
- අගරු වූ චෙක්පත්
- බැංකු සැසඳුම් ප්‍රකාශය
- ස්ථාවර නියෝග
- බැංකු ගාස්තු
- උපලබ්ධි නොවූ චෙක්පත්
- මාරු කිරීමට ඉදිරිපත් නොකළ චෙක්පත්
- බැංකු ප්‍රකාශය
- සංශෝධිත මුදල් ශේෂය
- සෘජු ප්‍රේෂණ

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

5.1 මුදලින් සිදුවන ගනුදෙනු වාර්තා කිරීම

නිෂ්පාදන, වෙළෙඳ හෝ සේවා යනාදී ලෙස ව්‍යාපාරවල ස්වභාවය විවිධ වේ. කවර ස්වභාවයකින් යුක්ත වුවද ඒවායේ ගනුදෙනු නිරතුරුව ම සිදුවේ. ව්‍යාපාරය සමග විවිධ පාර්ශවයන් අතර ඇතිවන සම්පත් හුවමාරුව හෝ ආර්ථික සිදුවීම් ගනුදෙනු ලෙස හැඳින් වේ.

ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු මූලික කොටස් දෙකකට බෙදිය හැකි ය.

ව්‍යාපාරික ගනුදෙනු
- අත්පිට සිදුවන ගනුදෙනු
- ණයට සිදුවන ගනුදෙනු

ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී ම මුදල් ලැබීම හා මුදල් ගෙවීම් සිදුවන ගනුදෙනු අත්පිට ගනුදෙනු වේ. ඒවා මුදලින් සිදුවන ගනුදෙනු ලෙසට ද හැඳින් වේ.

නිදසුන : • කිලෝ ග්‍රෑම් එකක් රු. 50/ බැගින් කෙසෙල් ගෙඩි කිලෝ ග්‍රෑම් 20ක් විකිණීම.

ගනුදෙනු ව සිදුවන අවස්ථාවේ දී නොව පසුව ඒ වෙනුවෙන් මුදල් ලැබීම් හෝ මුදල් ගෙවීම් සිදුවන ගනුදෙනු, ණයට සිදුවන ගනුදෙනු වේ.

නිදසුන : • කෝසලට කිලෝ ග්‍රෑම් එකක් රු. 50 බැගින් අඹ කිලෝ ග්‍රෑම් 20 ක් විකිණීම.

පහත සඳහන් රූප සටහන් 01 සහ 02 බලන්න.

රූප සටහන 5.1

රූප සටහන 5.2

රූප සටහන 5.1 අනුව ව්‍යාපාරය රු. 1,000 ක භාණ්ඩ විකිණීමක් කර ඇත. ව්‍යාපාරයට රු 1,000 මුදලක් ගනුදෙනුව සිදුවන විට ම ලැබී ඇත. එය අත්පිට සිදුවූ ගනුදෙනුවකි.

රූප සටහන 5.1 අනුව ව්‍යාපාරය කිලෝ ග්‍රෑම් එකක් රු 50 බැගින් අඹ කිලෝ ග්‍රෑම් 20 ක් කෝසලට ණයට විකුණා ඇත. ගනුදෙනුව සිදුවන අවස්ථාවේ දී මුදල් ලැබීමක් සිදු වී නැත. එබැවින් එය ණයට සිදු වූ ගනුදෙනුවකි. මෙහිදී ගනුදෙනුවට සම්බන්ධ ගනුදෙනුකරුගේ නම සඳහන් කර ගැනීම අවශ්‍ය වේ. ණයට සිදු වූ ගනුදෙනුවලදී ද මුදල් පසුව ලැබුන විට දී හා මුදල් පසුව ගෙවූ විට දී මුදල් පොතේ සටහන් කෙරේ.

මුදල් පොත සහ එහි කාර්යන්

සත්‍ය වශයෙන් සිදු වූ මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් පිළිබඳ තොරතුරු ඒවා සිදු වූ දින අනුපිළිවෙළ අනුව වාර්තා කරන පොත, මුදල් පොත (Cash book) වේ. මුදල් පොතකින් ඉටුවන මූලික කාර්යයන් දෙකකි. එනම්,

- මූලික සටහන් පොතක් ලෙස කටයුතු කිරීම.
- ලෙජර ගිණුමක් ලෙස කටයුතු කිරීම.

ව්‍යාපාරික ගනුදෙනු ලෙජර් ගිණුම්වල සටහන් කිරීමට ප්‍රථම සටහන් කරන පොත්, මූලික පොත් (Prime entry books) වේ. ගනුදෙනුවට අදළ මූලාශ්‍ර ලේඛන පදනම් කරගෙන මූලික සටහන් පොත් පිළියෙල කෙරේ.

මූලාශ්‍ර ලේඛන (Source documents) යනු ගනුදෙනුවලට අදළ පාර්ශවයන් ද මූල්‍ය වටිනාකම් ද කොන්දේසි ද අවශ්‍ය අනෙකුත් තොරතුරු ද සටහන් කර ඇති ලියවිලි වේ.

මේ අනුව මුදල් ගනුදෙනුවලට අදළ මූලාශ්‍ර ලේඛනවලින් ලබා ගන්නා තොරතුරු ප්‍රථමවරට මුදල් පොතේ වාර්තා කරන නිසා මුදල් පොත, මූලික සටහන් පොතක් බවට පත්වේ.

මුදල් ලැබීම් හා මුදල් ගෙවීම්වලට අදළ මූලාශ්‍ර ලේඛනවලින් බහුල ව භාවිත වන මූලාශ්‍ර ලේඛන වන්නේ **ලදුපත හා ගෙවීම් වවුචරය** යි. මුදල් ලැබීමේ දී ලදුපතක් ද මුදල් ගෙවීමේ දී ගෙවීම් වවුචරයක් ද භාවිත වේ. මේවායේ සඳහන් වන දිනය, විස්තරය, අංකය අදළ මුදල යනාදිය මුදල් පොතක ඒ ඒ තීරුවල සටහන් කෙරේ. එලෙස සටහන් කරනුයේ ඒවා සිදු වූ දින අනුපිළිවෙළ අනුව වේ.

මුදල් පොත, ලෙජර ගිණුමක් ලෙස කටයුතු කරන්නේ කුමන ආකාරයෙන් ද යන්න මීළඟට සලකා බලමු. ලෙජර ගිණුමක් යනු ගනුදෙනුවක ද්විත්ව බලපෑම ද්විත්ව සටහන් මූලධර්මවලට අනුව වාර්තා කරන ආකෘතියකි. මුදල් 'වත්කම්' ගිණුම් වර්ගයට අයත් වූවකි. එබැවින් වත්කම්වලට අදාළ ද්විත්ව සටහන් මූලධර්මය අනුව මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් මුදල් පොතේ සටහන් කෙරේ. මෙහි දී වත්කම් වැඩිවීම 'හර' ටත් වත්කම් අඩුවීම 'බැර'ටත් සටහන් වන නිසා,

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

* මුදල් වැඩිවීම, මුදල් පොතේ (මුදල් ගිණුමේ) 'හර' ටත්
* මුදල් අඩුවීම, මුදල් පොතේ (මුදල් ගිණුමේ) 'බැර' ටත් සටහන් කෙරේ.

මේ අනුව මුදල් ලැබීම් මුදල් පොතේ 'හර' ට සටහන් වන නිසා ඊට අදාළ 'බැර' සටහන් අනෙක් ලෙජර් ගිණුම්වල සටහන් වේ. මුදල් ගෙවීම් මුදල් පොතේ 'බැර' ට සටහන් වන නිසා ඊට අදාල 'හර' සටහන් අනෙක් ලෙජර ගිණුම්වල සටහන් වේ. මෙලෙස ද්විත්ව සටහන් මූලධර්මවලට අනුව මුදල් පොතක සටහන් ඇතුළත් කැරෙන නිසා එය ලෙජර් ගිණුමක් ලෙසට ද කටයුතු කෙරෙන බව පැහැදිලි වේ.

මුදල් පොතක් පවත්වාගෙනයාමේ ප්‍රයෝජන

* කාල සීමාව තුළ ලැබූ මුදල් ප්‍රමාණය දැන ගැනීමට හැකි වීම.
* කාල සීමාව තුළ වැයකළ මුදල් ප්‍රමාණය දැන ගැනීමට හැකි වීම.
* කාල සීමාව අවසන් දිනට මුදල් ශේෂය දැන ගැනිමට හැකි වීම.
* මුදල් ගනුදෙනු වලට අදාළ ලැබීම් සහ ගෙවීම් තොරතුරු වෙන වෙනම ඉදිරිපත් කිරීමට හැකිවීම.
* සීමාසහිත වත්කමක් වන 'මුදල්' පාලනයකින් යුතුව පවත්වා ගැනීමට අවශ්‍ය මඟපෙන්වීමක් සැපයීම.
* මුදල් කටයුතු පිළිබඳ තීරණ ගැනීමට හැකිවීම.

ව්‍යාපාරයකට මුදල් ලැබෙන මාර්ග විවිධ වේ.

නිදසුන් :

- ව්‍යාපාරය ආරම්භ කිරීමේ දී අයිතිකරු යොදවන මුදල්.
- පසු අවස්ථා වලදී අයිතිකරු ව්‍යාපාරයට යොදවන මුදල්.
- භාණ්ඩ හා සේවා විකිණීම්, කඩකුලී ලැබීම්, ආයෝජන ආදායම් ආදී "ආදායම්" වලින් ලැබෙන මුදල්.
- බැංකු ණය උකස් ණය, ආදී ලෙසට ලබාගන්නා මුදල්.
- මෝටර් රථ, ලීබඩු, යන්ත්‍ර ආදී වත්කම් විකිණීමෙන් ලැබෙන මුදල්.
- ණයගැතියන් ගෙන් ලැබෙන මුදල්.
- පරිත්‍යාග ආකාරයෙන් ලැබෙන මුදල්.

ව්‍යාපාරයක් තුළට ලැබෙන මුදල් නැවත ව්‍යාපාරයෙන් පිටතට ඇදී යයි.

නිදසුන් :

- අයිතිකරු තම පෞද්ගලික අවශ්‍යතාවන් සඳහා ව්‍යාපාරයෙන් මුදල් ලබා ගැනීම.
- ගමන් ගාස්තු, සේවක වේතන, රක්ෂණ ගාස්තු යනාදී වියදම් මුදලින් ගෙවීම.
- ලබාගත් බැංකු ණය, උකස් ණය යනාදිය ආපසු ගෙවීම සහ ලබාගත් ණය මුදල් සඳහා පොළී ගෙවීම්.
- මොටර් රථ, යන්ත්‍ර, ලීබඩු යනාදී වත්කම් මිලදී ගැනීමට මුදල් ගෙවීම.
- ණය හිමියන්ට මුදල් ගෙවීම.

ක්‍රියාකාරකම් 01

අ. ව්‍යාපාරයක 20xx වර්ෂයේ ජනවාරි මස පළමු සතිය තුළ සිදු විය හැකි එකිනෙකට වෙනස් අත්පිට ගනුදෙනු හා ණයට වූ ගනුදෙනු සඳහා නිදසුන් 5 බැගින් ලියන්න.

ආ. එම ව්‍යාපාරයේ 20xxx0101 දිනට රු. 250,000 ක මුදලක් ඉතිරි ව තිබුණේ නම් ඉහත (අ) හි ඔබ විසින් සඳහන් කළ ගනුදෙනු අවසානයේ දී ඉතිරි වූ මුදල් ප්‍රමාණය කොපමණවේ දැයි දක්වන්න.

ඇ. ඉහත (අ) හි ඔබ දැක් වූ ගනුදෙනු නිසා ආරම්භක මුදල් ශේෂය වැඩි වීමට හා අඩු වීමට බලපෑ ගනුදෙනු වගුවකින් ඉදිරිපත් කරන්න.

ඈ. මුදල් ගනුදෙනු වාර්තා කිරීම, ව්‍යාපාරයකට වැදගත් වන්නේ කවර හේතු නිසා ද? පැහැදිලි කරන්න.

ඉ. i. මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් සටහන් කිරීමට යොදා ගන්නා මූලික පොත කවරක් ද?

ii. මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් මුදල් පොතක සටහන් කරන්නේ කවර ද්විත්ව සටහන් මූල ධර්මය අනුව ද?

5.2 තනි තීරු සහ ද්විත්ව තීරු මුදල් පොත

ව්‍යාපාරයක සිදුවන මුදල් ලැබීම් සහ මුදල් ගෙවීම්වල ස්වරූපය අනුව මුදල් පොත් පිළියෙල කළ යුතු ය. මුදල් ලැබීම් සහ මුදල් ගෙවීම්වල ස්වරූපය යනු මුදල් ගනුදෙනුව සිදුවූයේ කාසි හා නෝට්ටුවලින් ද? නැතහොත් චෙක්පත්වලින් ද? යන්න ය. ඒ අනුව මුදල් පොතක වටිනාකම දක්වෙන තීරු වෙන වෙනම සකසා ගත හැකිවේ.

ව්‍යාපාරවල, කාසි හා නෝට්ටුවලින් සිදුකරන මුදල් ගනුදෙනුවලට අමතර ව 'චෙක්පත්' භාවිත කිරීම ද සිදුවේ. චෙක්පත් මගින් ගනුදෙනු පවත්වා ගැනීම සඳහා වාණිජ බැංකුවක ජංගම ගිණුමක් (ඉල්ලුම් තැන්පතු) විවෘත කර ගත යුතු වේ. චෙක්පත් මගින් ගනුදෙනු කිරීම වර්තමානයේ බහුල ව සිදු වේ.

මේ අනුව ව්‍යාපාරයක මුදල් ගනුදෙනු සිදු කෙරෙන ආකාර දෙකකි.

- කාසි හා නෝට්ටු මගින්
- චෙක්පත් මගින්

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

තනි තීරු මුදල් පොත

වනාපාරයක් කාසි හා නෝට්ටු මඟින් පමණක් ගනුදෙනු කිරීමේ දී එම ගනුදෙනු සටහන් කිරීම සඳහා පිළියෙල කරනු ලබන මුදල් පොත තනි තීරු මුදල් පොත වේ.

තනිතීරු මුදල් පොතක ආකෘතියක් පහත දැක්වේ.

හර මුදල් පොත බැර

දිනය	ලදුපත් අංකය	විස්තරය	ස. පි	වටිනාකම (රු.)	දිනය	වවුචර් අංකය	විස්තරය	ස පි	වටිනාකම (රු.)

මුදල් ලැබුන බවට හෝ මුදල් ගෙවූ බවට සනාථ කිරීමට යොදා ගන්නා ලිඛිත සාක්ෂි, මුදල් පොතක මූලාශ්‍ර ලේඛන වේ. එනම්,

* මුදල් ලැබීමේ දී, ලදුපත්.
* මුදල් ගෙවීමේ දී, ගෙවුම් වවුචර එවැනි මූලාශ්‍ර ලේඛන වේ.

ලදුපත (Receipt)

වනාපාර ආයතනයකට මුදල් ලැබුණ බව සනාථ කරමින්, එහි වගකිව යුතු පුද්ගලයකු විසින්, තම අත්සන යොදා නිකුත් කරන ලේඛනය, ලදුපත වේ. මෙය මුදල් ලැබීමේ රිසිට්පත, මුදල් ලැබීමේ කුවිතාන්සිය, මුදල් මැමය (Cash Memo) යනා දී නම් වලින් ද හැඳින්වේ.

ලදුපත, මුල්පිටපත හා අනුපිටපත ලෙස එකම අංකයකින් යුතු පිටපත් දෙකකින් හෝ කිහිපයකින් යුක්ත වේ. මුල්පිටපතෙහි ලියන ලද විස්තර අනුපිටපතෙහි සටහන් වේ. මෙහි මුල්පිටපත ගනුදෙනුකරුට නිකුත් කළ පසු අනුපිටපත ලදුපොතෙහි ඉතිරිවේ. එලෙස ඉතිරිවන අනුපිටපත්වල ඇති තොරතුරු පදනම් කරගනිමින්, මුදල් පොතෙහි වාර්තා කිරීම සිදුකෙරේ.

ලදුපතක ආදර්ශයක් පහත දැක්වේ. එය නිරීක්ෂණය කරන්න.

ලදුපත

අංකය : 20545

සඳමාලි ව්‍යාපාරය,
බුද්ධ ජයන්ති මාවත,
නාඹටුන්න.
දු.ක. 0145336281
දිනය ....

.... ට සැපයූ අංක .... දරන ඉන්වොයිසිය සඳහා ලැබිය යුතු රු. .... මුදල .... චෙක්පතකින්/මුදලින් ස්තුතියෙන් භාර ගතිමි.

රු. ....

මුද්දරය මත අත්සන

ගෙවීම් වවුචරය (Payment Voucher)

ව්‍යාපාර ආයතනයක් මුදල් ගෙවීමේ දී භාවිත කරන මූලාශ්‍ර ලේඛනය, ගෙවීම් වවුචරය වේ. වලංගු මුදලින් හෝ චෙක්පත්වලින් හෝ ගෙවීම් සිදුකිරීමේ දී එයට අදළ මූලික තොරතුරු වවුචරයේ සටහන් කෙරේ.

අත්පිට ගැණුම්, ණයහිමි ගෙවීම්, වැටුප් ගෙවීම් ආදී සියලු ම ගෙවීම් සිදු කරන විට ව්‍යාපාරය ගෙවීම් වව්චර භාවිත කෙරේ. ඒවායේ දැක්වෙන තොරතුරු පදනම් කර ගනිමින් මුදල් පොතක සටහන් කිරීම සිදුවේ.

ගනුදෙනුව සිදුවූ බවටත් ඊට අදළ ගෙවීම් සිදුකළ බවටත් ලිඛිත සාක්ෂියක් ලෙස මෙම මූලාශ්‍ර ලේඛනය වැදගත් වේ.

පහත දක්වෙන ගෙවීම් වවුචරය නිරීක්ෂණය කරන්න.

සඳමාලි ව්‍යාපාරය
බුද්ධ ජයන්ති මාවත
නාඹටුන්න.

රු. .... දිනය ....
රුපියල්..
....
....වෙත
ගෙවන ලදී.
විස්තරය ....
....

වවුචර අංකය
....
චෙක්පත් අංකය
....
මුදල
රු. ....
ගෙවූ දිනය
....
අනුමත කළේ
....
ගිණුම
....

ඉන්වොයිසි අංකය : .... බිල් අංකය : .... ලදුපත් අංකය : ....

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මුදල් පොතක ගනුදෙනු සටහන් කිරීම

මෙතැන් සිට ව්‍යවහාර මුදලින් සිදු කෙරෙන මුදල් ගනුදෙනු මුදල් පොතක සටහන් කෙරෙන අන්දමත්, මුදල්පොත අනුව ශේෂය ගණනය කෙරෙන අන්දමත් සාකච්ඡා කරමු.

01. 20xx0101 දින සඳමාලි රු. 30,000 ක් යොදා පලතුරු මිලට ගෙන නැවත විකිණීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම.

ව්‍යාපාරයට රු. 30,000 ක මුදලක් ලැබී ඇත. එය ව්‍යාපාරයේ 'මුදල්' වත්කම වේ. එම රු. 30,000 වත්කම වෙනුවෙන් සඳමාලිට ඇති අයිතිය ද රු. 30,000 කි. සඳමාලිගේ අයිතිය ප්‍රාග්ධනය වේ.
'මුදල්' වත්කම් ගිණුම් වර්ගයට අයත් වන නිසා 'වත්කම් වැඩිවීම' හර ලෙස සටහන් වේ. එබැවින් රු 30,000, මුදල් පොතට හර කෙරේ.

02. 20xx0102 බැංකුවෙන් රු 25,000 ක ණය මුදලක් ලබා ගැනීම. (ලදුපත් අංක 001)

ණය මුදල ගත් නිසා ව්‍යාපාරයේ මුදල් වත්කම රු 25,000 කින් වැඩිවේ.
එම ණය මුදල ආපසු බැංකුවට ගෙවියයුතු බැවින් බැංකු ණය ලෙස රු. 25,000 ක වගකීමක් ඇතිවේ.
වත්කම් වැඩිවීම හර ලෙසට සටහන් වන නිසා ලබාගත් රු. 25,000 මුදල් පොතට හර කෙරේ.

03. 20xx0104 ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 4,500 ක ලීබඩු මිලදී ගැනීම (වවුචර අංක 001)

ලී බඩු මිලදී ගැනීම නිසා ව්‍යාපාරයේ මුදල් වත්කම රු. 4,500 කින් අඩුවේ.
ලි බඩු ලෙස රු. 4,500 ක නව වත්කමක් බිහිවේ.
මුදල් වත්කම රු. 4,500 කින් අඩුවීම මුදල් පොතට බැර කෙරේ.

04. 20xx0105 විකිණීම සඳහා රු. 20,000 ක පළතුරු තොගයක් මිලදී ගැනීම. (වවුචර අංක 002)

ව්‍යාපාරයේ මුදල් වත්කම රු 20,000 කින් අඩුවේ.
ඒ සමග ම භාණ්ඩ තොග (පළතුරු) ලෙස රු. 20,000 ක වත්කමක් බිහිවේ.
මුදල් වත්කම රු 20,000 කින් අඩුවීම මුදල් පොතට බැර කෙරේ.

05. 20xx0105 මිලදීගත් පළතුරු ව්‍යාපාරයට ගෙන ඒම සඳහා රු 500 ක වාහන කුළියක් ගෙවීමට සිදුවීම. (වවුචර අංක 003)

ව්‍යාපාරයෙන් රු. 500 ක මුදලක් පිටතට ඇදී යාම නිසා, මුදල් වත්කම රු.500 කින් අඩුවේ.
ඒ සමගම ගෙනඒමේ කුලී ලෙස රු. 500 ක වියදමක් බිහිවේ.
මුදල් වත්කම රු. 500 කින් අඩුවීම, මුදල් පොතට බැර කෙරේ.

06. 20xx0106 රු. 3,500 ක මුදලක් භාණ්ඩ (පලතුරු) විකිණීමෙන් ලබා ගැනීම. (ලදුපත් අංක 002)

රු. 3,500 ක මුදලක් ව්‍යාපාරයට ලැබෙන නිසා, මුදල් වත්කම රු. 3,500 කින් වැඩිවේ.
ඒ සමගම රු. 3,500 ක විකුණුම් ආදායමක් බිහිවේ.
මුදල් වත්කම රු. 3,500 කින් වැඩිවීම මුදල් පොතට හර කෙරේ.

07. 20xx0107 රු. 4,000 කට භාණ්ඩ (පලතුරු) තොගයක් කෝසලට විකිණීම.

මෙම ගනුදෙනුව ණයට සිදුවූවකි. ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී මුදල් හුවමාරුවක් සිදුනොවූ නිසා මුදල් පසුව ලැබීමට නියමිතයි. ණයට භාණ්ඩ විකිණීම තුළින් "ණය ගැති" වත්කමක් බිහිවේ. ණය ගැතියා වන්නේ කෝසලයි.
මේ අනුව ණයට සිදු වූ ගනුදෙනුවේ වටිනාකම මුදල් පොතේ සටහන් නොකෙරේ.

08. 20xx0110 රු. 2,000 ක මුදලක් බැංකු ණයෙන් කොටසක් පියවීම සඳහා ගෙවීම. (වවුචර අංක 004)

බැංකු ණය ගෙවීම නිසා ව්‍යාපාරයේ මුදල් වත්කම රු. 2,000 කින් අඩුවේ.
ඒ සමඟම බැංකුවට ගෙවියයුතු ණය මුදලද රු. 2,000 කින් අඩුවේ.
මුදල් වත්කම රු. 2000 කින් අඩුවීම නිසා මුදල් පොතට බැර කෙරේ.

09. 20xx0112 විකිණීම සඳහා රු. 8,000 ක පළතුරු තොගයක් මිහිරි පලතුරු ව්‍යාපාරයෙන් ණයට ගැනීම.

පලතුරු තොගය මිල දී ගෙන ඇත්තේ, මුදල් පසුව දීමේ ක්‍රමයටයි. මෙය ණයට සිදුවූ ගනුදෙනුවක් නිසා ඒ අවස්ථාවේ දී මුදල් හුවමාරුවක් සිදුවී නැත. එබැවින් එය ව්‍යාපාරයේ වගකීමකි. එම වගකීම ''ණයහිමියෝ" ලෙස දැක්වේ. මෙහි ණයහිමියා වන්නේ මිහිරි පලතුරු ව්‍යාපාරයයි.
මේ අනුව ණයට සිදුවූ ගනුදෙනුව මුදල් පොතේ සටහන් නොකෙරේ.

10. 20xx0113 කෝසල ගෙන් රු. 2,500 ක මුදලක් ලැබීම. (ලදුපත් අංක 03)

රු. 2,500 ක මුදලක් ලැබීමෙන් මුදල් වත්කම රු. 2,500 කින් වැඩිවී ඇත.
ණය ගැති වත්කම (කෝසල) රු. 2,500 කින් අඩු වී ඇත.
මුදල් වත්කම් රු. 2,500 කින් වැඩි වීම නිසා මුදල් පොතට හර කෙරේ.

11. 20xx0114 මිහිරි පලතුරු ව්‍යාපාරයට (ණය හිමියාට) රු. 3,000 ක මුදලක් ගෙවීම (වවුචර අංක 005)

ණය හිමියන්ට ගෙවීම නිසා ව්‍යාපාරයේ මුදල් වත්කම රු. 3,000 කින් අඩුවේ.
ඒ සමඟම ණයහිමි වගකීමද රු. 3,000 කින් අඩු වේ.
මුදල් වත්කම රු. 3,000 කින් අඩු වීම නිසා මුදල් පොතට බැර කෙරේ.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

12. 20xx0115 අයිතිකරු වූ සඳමාලි ව්‍යාපාරයෙන් රු. 500 ක මුදලක් තම පෞද්ගලික අවශ්‍යතාවකට ආපසු ගැනීම. (වවුචර් අංක 006)

අයිතිකරු හා ව්‍යාපාරය යනු එකිනෙකට වෙනස් වූ ඒකක දෙකක් බව අපි දනිමු. අයිතිකරු ව්‍යාපාරයේ ඇති මුදල්වලින් රු. 500 ක් තම පෞද්ගලික අවශ්‍යතාවයට ගැනීම නිසා ව්‍යාපාරයේ වත්කම්වලට ඇති තම අයිතිය (ප්‍රාග්ධනය) රු. 500 කින් අඩු වේ.

ඒ සමඟ ම ව්‍යාපාරයේ මුදල් වත්කම ද රු. 500 කින් අඩු වේ. එබැවින් මුදල් පොතට රු. 500 ක් බැර කෙරේ. මෙය ගිණුම්කරණයේ දී "ගැනිලි" ලෙස හඳුනා ගැනේ.

ඉහත දැක්වූ ගනුදෙනු මුදල් පොතක සටහන් කරන ආකාරයත් මුදල් පොත තුලනය කර ශේෂය සටහන් කෙරෙන ආකාරයත් පහත දැක්වේ.

ලෙ.පි. 01

මුදල් පොත

හර | බැර

දිනය	ලදුපත් අංකය	විස්තරය	ස පි	මුදල් රු ශ.	දිනය	වවුචර් අංකය	විස්තරය	ස පි	මුදල් රු ශ.
20xx					20xx				
01.01		ප්‍රාග්ධනය	ලෙ.01	30,000	01.04	001	ලී බඩු	ලෙ.03	4,500
01.02	001	බැංකු ණය	ලෙ.02	25,000	01.05	002	ගැණුම්	ලෙ.04	20,000
01.06	002	විකුණුම්	ලෙ.06	3,500	01.05	003	ගෙනඒමේ කුලී	ලෙ.05	500
01.13	003	කෝසල	ලෙ.07	2,500	01.10	004	බැංකු ණය	ලෙ.02	2,000
					01.14	005	මිහිරි පළතුරු	ලෙ.08	3,000
					01.15	006	ගැනිලි	ලෙ.09	500
					01.15		ශේෂය ප/ගෙ		30,500
				61,000					61,000
01.16		ශේෂය ඉ/ගෙ		30,500					

මෙම ව්‍යාපාරයේ ගිණුම් කාලය 20xx.01.01 න් ආරම්භ වී 20xx.01.15 දිනෙන් අවසන් වේ යැයි උපකල්පනය කිරීම මත මුදල් පොත (මුදල් ගිණුම) තුලනය කර ඇත. 20xx.01.16 දිනට අත ඉතිරි මුදල් ශේෂය රු. 30,500 කි.

ලෙජර් සටහන්

ව්‍යාපාරික ගනුදෙනුවල ද්විත්ව බලපෑමක් පවතී. එම ද්විත්ව බලපෑම එකවර ලෙජර ගිණුම් දෙකක හර හා බැර ලෙස සටහන් කෙරේ. මුදල් පොත, ලෙජර් ගිණුමක් ලෙසට කටයුතු කරන නිසා මුදල් ලැබීම් "හර" ටත් මුදල් ගෙවීම් "බැර" ටත් මුදල් පොතක ඇතුළත් කෙරේ.

මෙලෙස මුදල් පොතේ ඇතුළත් වූ "හර" සටහනට අදළ "බැර" සටහන අදළ අනෙක් ලෙජර ගිණුමේ සටහන් කළ යුතු ය. මුදල් පොතේ ඇතුළත් වූ "බැර" සටහනට අදළ "හර" සටහන අදළ අනෙක් ලෙජර් ගිණුමේ සටහන් කළ යුතු ය.

ඉහත තනි තීරු මුදල් පොතට අදළ අනෙකුත් ලෙජර ගිණුම් පහත දක්වේ.

ලෙ. පි. 01

හර ප්‍රාග්ධන ගිණුම බැර

දිනය	විස්තරය	ස පි	මුදල රු.	ශත	දිනය	විස්තරය	ස පි	මුදල රු.	ශත
					20xx.01.01	මුදල්	මු 01	30,000	00

ලෙ. පි. 02

හර බැංකු ණය ගිණුම බැර

දිනය	විස්තරය	ස පි	මුදල රු.	ශත	දිනය	විස්තරය	ස පි	මුදල රු.	ශත
20xx.01.10	මුදල්	මු 01	2,000	00	20xx.01.02	මුදල්	මු 01	25,000	00

ලෙ. පි. 03

හර ලී බඩු ගිණුම බැර

දිනය	විස්තරය	ස පි	මුදල රු.	ශත	දිනය	විස්තරය	ස පි	මුදල රු.	ශත
20xx.01.04	මුදල්	මු 01	4,500	00					

ලෙ. පි. 04

හර ගැනුම් ගිණුම බැර

දිනය	විස්තරය	ස පි	මුදල රු.	ශත	දිනය	විස්තරය	ස පි	මුදල රු.	ශත
20xx.01.05	මුදල්	මු 01	20,000	00					
20xx.01.12	මිහිරි පළතුරු	ලෙ08	8,000	00					

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ලෙ. පි. 05

හර **ගෙන ඒමේ කුලී ගිණුම** බැර

දිනය	විස්තරය	ස පි	මුදල		දිනය	විස්තරය	ස පි	මුදල	
			රු.	ශත				රු.	ශත
20xx.01.05	මුදල්	මු 01	500	00					

ලෙ. පි. 06

හර **විකුණුම් ගිණුම** බැර

දිනය	විස්තරය	ස පි	මුදල		දිනය	විස්තරය	ස පි	මුදල	
			රු.	ශත				රු.	ශත
					20xx.01.06	මුදල්	මු 01	3,500	00
					20xx.01.07	කෝසල	ලෙ07	4,000	00

ලෙ. පි. 07

හර **කෝසල ගිණුම** බැර

දිනය	විස්තරය	ස පි	මුදල		දිනය	විස්තරය	ස පි	මුදල	
			රු.	ශත				රු.	ශත
20xx.01.7	විකුණුම්	ලෙ 06	4,000	00	20xx.01.13	මුදල්	මු 01	2,500	00

ලෙ. පි. 08

හර **මිහිරි පලතුරු ගිණුම** බැර

දිනය	විස්තරය	ස පි	මුදල		දිනය	විස්තරය	ස පි	මුදල	
			රු.	ශත				රු.	ශත
20xx.01.14	මුදල්	මු 01	3,000	00	20xx.01.12	ගැණුම් ගිණුම	ලෙ 08	8,000	00

ගැනිලි ගිණුම

ලෙ. පි. 09

හර | බැර

දිනය	විස්තරය	ස පි	මුදල		දිනය	විස්තරය	ස පි	මුදල	
			රු.	ශත				රු.	ශත
20xx.01.15	මුදල්	මු 01	500	00					

ක්‍රියාකාරකම් 02

රොෂානී තම රු. 250,000 ක ස්ථාවර තැන්පතුව ආපසු ලබා ගෙන 20xx.01.01 දින නිමි ඇඳුම් මිලට ගෙන විකිණීමේ ව්‍යාපාරයක් ආරම්භ කළා ය. මුදල් ලදු පොතක්, ගෙවීම් වවුචරපත් ආදී ලිපිද්‍රව්‍ය වෙනුවෙන් රු. 2,500 ක් වැය කළා ය.

ජනවාරි මාසයේ සිදු කළ ගනුදෙනුවලට අදළ ව ඇය විසින් මූලාශ්‍ර ලේඛන ගොනුවක් තබා ගත්තාය.

ලදු පොත පරීක්ෂා කිරීමේදී පහත කරුණු අනාවරණය විය.

දිනය	ලදුපත් අංක	විස්තරය
20xx		
01 05	001	එකක් රු 650 බැගින් කමිස 15 ක් විකිණීම.
01 08	002	කෝසල ගෙන් රු. 3,000 ක් ලැබීම.
01 12	003	එකක් රු. 400 බැගින් ළමා ඇඳුම් 10 ක් විකිණීම.
01 16	004	කෝසලගෙන් රු. 5,000 ක් ලැබීම.
01 18	005	එකක් රු 800 බැගින් සාරි 20 ක් විකිණීම.
01 25	006	කෝසල ගෙන් රු 4,000 ක් ලැබීම.
01 28	007	එකක් රු 1,200 බැගින් කලිසම් 15 ක් විකිණීම.
01 29	008	කෝසලගෙන් රු. 3,000 ක් ලැබීම.
01 30	009	එකක් රු. 700 බැගින් කමිස 20 ක් විකිණීම.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ගෙවීම් වවුචරපත් අඩංගු ලිපි ගොනුවෙන් පහත සඳහන් විස්තර සැපයේ.

දිනය	ගෙවීම් වවුචර් පත් අංකය	විස්තරය
20xx		
0101	500	ව්‍යාපාරයේ ප්‍රයෝජනයට රු. 8,000 ක ලීබඩු මිලදී ගැනීම
0102	501	එකක් රු.400 බැගින් කමිස 50 ක් මිලදී ගැනීම.
0102	502	ගෙනඒමේ කුලී රු. 600 ක් ගෙවීම.
0106	503	ගෙවල්කුලී රු. 2,000 ක් ගෙවීම.
0109	504	එකක් රු 225 බැගින් ළමා ඇඳුම් 60 ක් ගැනීම.
0113	505	නිලූෂාන්ට රු. 12,000 ක් ගෙවීම.
0120	506	සේවක වැටුප් රු. 3,000 ක් ගෙවීම.
0122	507	එකක් රු. 750 බැගින් කලිසම් 40 ක් ගැනීම.
0122	508	ගෙනඒමේ කුලී රු. 600 ක් ගෙවීම.
0124	509	නිලූෂාන්ට රු. 16,000 ක් ගෙවීම.
0125	510	සේවක වැටුප් රු. 3,000 ක් ගෙවීම.
0128	511	එකක් රු. 480 බැගින් සාරි 60 ක් ගැනීම.
0130	512	ගෙවල් කුලී රු. 2,000 ක් ගෙවීම.
0131	513	නිලූෂාන්ට රු. 8,000 ක් ගෙවීම.

අවශ්‍ය දේ,

අ. මුදල් ලැබීම් හා මුදල් ගෙවීම්වලට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කරන්න.

ආ. රොෂානි ව්‍යාපාරයේ මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් හඳුනාගෙන මුදල් පොතක සටහන් කරන්න.

ඇ. 20xx.01.31 දිනට මුදල් පොත තුලනය කර අත ඉතිරි මුදල් ශේෂය ගණනය කරන්න.

ඈ. මුදල් පොතේ ඇතුළත් කළ තොරතුරු ලෙජරයට පිටපත් කරන්න.

ඉ. මෙම අභ්‍යාසයේ දැක්වෙන තොරතුරුවලට අමතර ව ව්‍යාපාරයකට මුදල් ලැබෙන වෙනත් මාර්ග හා ව්‍යාපාරයේ මුදල් වැයවන වෙනත් මාර්ග වෙන වෙන ම සඳහන් කරන්න.

ද්විත්ව තීරු මුදල් පොත

තනි තීරු මුදල් පොතක වටිනාකම සඳහන් කෙරෙන මුදල් තීරුවට අමතර ව බැංකු තීරුව එක් වූ විට මුදල් පොත "ද්විත්ව තීරු මුදල් පොත" බවට පත් වේ. වාණිජ බැංකුවේ විවෘත කරනු ලබන "ජංගම ගිණුම" සමග සිදු කෙරෙන මුදල් ගනුදෙනු බැංකු තීරුවේ සටහන් කරනු ලැබේ.

බැංකු තීරුවේ සටහන් ඇතුළත් කිරීම, ඊට අදාළ මූලාශ්‍ර ලේඛන පදනම් කරගෙන සිදු කෙරේ. එවැනි මූලාශ්‍ර ලේඛන පහත දැක්වේ.

අවස්ථාව	මූලාශ්‍ර ලේඛනය
මුදල් තැන්පත් කිරීම	මුදල් තැන්පතු පත්‍රය
චෙක්පත් තැන්පත් කිරීම	චෙක්පත් තැන්පතු පත්‍රය
චෙක්පත් නිකුත් කිරීම	පිළිපත
චෙක්පත් අගරු වීම	අගරු චෙක් දැනුම් දීමේ ලියවිල්ල හෝ බැංකු ප්‍රකාශය
මුදල් පොතේ සටහන් නොවූ බැංකු ගනුදෙනු සටහන් කිරීම	බැංකු ප්‍රකාශය

මුදල් තැන්පතු පත

මුදල් තැන්පතු පත යොදා ගනිමින් බැංකු ජංගම ගිණුමේ මුදල් තැන්පත් කිරීම සිදු වේ. පිටපත් දෙකකින් යුක්ත වන මෙම බැර තුණ්ඩුවේ අනු පිටපත (ගිණුම් හිමියාට) ව්‍යාපාරයට ලබා දේ. බැංකු තීරුවේ වටිනාකම ඇතුළත් කිරීමේ දී එම අනුපිටපත මූලාශ්‍ර ලේඛනය බවට පත්වේ.

මුදල් තැන්පත් කිරීමේ පත්‍රයක ආකෘතියක් පහත දක්වේ. එය නිරීක්ෂණය කරන්න.

Deposit Credit

BOC

Branch

මුදල් තැන්පතුව

CASH DEPOSIT

Date

Name of Account Holder

Account Number

Any other Particulars

Amount

Rs.

Depositor's Signature

Valid with Machine Print or Official Signature

චෙක්පත් තැන්පත් කිරීමේ පත

ව්‍යාපාරයට ලැබෙන චෙක්පත් බැංකුවේ තැන්පත් කිරීමේ දී චෙක් තැන්පත් කිරීමේ පත භාවිතයට ගනී. පිටපත් දෙකකින් යුක්ත වන මෙහි අනුපිටපත (ගිණුම් හිමියාට) ව්‍යාපාරයට ලැබේ. මුදල් පොතේ සටහන් ඇතුළත් කිරීමේ දී එම අනුපිටපත මූලාශ්‍ර ලේඛනයක් බවට පත් වේ.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

පහත දැක්වෙන චෙක් තැන්පත් කිරීමේ පත්‍රය නිරීක්ෂණය කරන්න.

ඇතැම් විට බැංකු ජංගම ගිණුමේ මුදල් හා චෙක්පත් යන දෙවර්ගය ම තැන්පත් කිරීමේ දී 'තැන්පතුපත' ලෙස එක් පත්‍රිකාවක් භාවිතයට ගත හැකි අවස්ථා ද පවතී. එය ද පිටපත් දෙකකින් යුක්ත වේ. අනුපිටපත ව්‍යාපාරයට (ගිණුම් හිමියාට) ලබාදේ. මුදල් පොතේ තොරතුරු සටහන් කිරීමේ දී එම අනුපිටපත මූලාශ්‍ර ලේඛනයක් ලෙස යොදා ගනී.

චෙක්පතේ පිළිපත (Counter foil)

විවිධ ගෙවීම් සඳහා චෙක්පත් නිකුත් කරන විට ඒවාට අදාළ මූලික තොරතුරු චෙක්පතේ වම්පස ඇති කොටසෙහි සඳහන් කරනු ලබයි. මෙම කුඩා කොටස 'පිළිපත' වන අතර මුදල් පොතේ සටහන් ඇතුළත් කිරීමේ දී එය මූලාශ්‍ර ලේඛනයක් ලෙසට යොදා ගනී.

පහත දැක්වෙන චෙක්පතේ I කොටසින් දැක්වෙන්නේ පිළිපත වේ. II කොටසින් දැක්වෙන්නේ චෙක්පත වේ.

I කොටස II කොටස



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

අගරු චෙක්පත් දැනුම් දීමේ නිවේදනය (Cheque return notification)

තැන්පත් කිරීම සඳහා හෝ ගෙවීම සඳහා ව්‍යාපාරයක් විසින් බැංකුවට ඉදිරිපත් කළ චෙක්පත් යම් යම් හේතු මත ගෙවීම ප්‍රතික්ෂේප කිරීම, අගරු වීම යන්නෙහි අදහසයි. මෙලෙස අගරු වූ චෙක්පත් බැංකුව විසින් ඒවා තැන්පත් කළ ගනුදෙනුකරුට ආපසු ලැබීමට සැලැස් විය යුතු ය. වර්තමානයේ දී අගරු චෙක්පත වෙනුවට ලැබෙන්නේ 'අගරු චෙක්පත් පිළිබඳ නිවේදනය' කි.

එහි අගරු වූ චෙක්පත පිළිබඳ සියලු විස්තර අඩංගු වේ. එය අගරු වූ චෙක්පත වෙනුවට යොදා ගත හැකි ආදේශක ලේඛනය වේ. මෙම නිවේදනය, චෙක්පත නිකුත් කළ තැනැත්තාට ඉදිරිපත් කර නැවත නව චෙක්පතක් හෝ මුදල් හෝ ලබා ගැනීමට ව්‍යාපාරයට කටයුතු කළ හැකි ය.

පහත දැක්වෙන 'අගරු චෙක්පත් පිළිබඳ නිවේදන' ආදර්ශය නිරීක්ෂණය කරන්න.

LANKACLEAR

Cheque Return Notification (CRN)

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

බැංකු ප්‍රකාශය (Bank Statement)

ව්‍යාපාරයට (ජංගම ගිණුම් හිමියාට) බැංකුව සමග සිදු කළ ගනුදෙනුවල විස්තර ඇතුළත් කොට වාණිජ බැංකුව විසින් එවනු ලබන වාර්තාව, **බැංකු ප්‍රකාශය** වේ. මෙය බැංකු ගිණුම් විස්තරය නමින් ද හැඳින් වේ.

මුදල් පොතේ බැංකු තීරුවේ ඇතුළත් කර ඇති තොරතුරු පරීක්ෂා කිරීමට, මුදල් පොතේ ඇතුළත් නොවූ තොරතුරු ඇතුළත් කිරීමට මෙම 'බැංකු ප්‍රකාශය' මූලාශ්‍ර ලේඛනයක් ලෙස යොදා ගනී.


මහීෂා සඳමාලි මෙ.වි.
බුද්ධ ජයන්ති මාවත,
නාඔටුන්න.

නාඔටුන්න ශාඛාව

0034 02 39016

0103xx	ශේෂය ඉ/ගෙ			16000
0303xx	මුදල් තැන්පතු		13000	29000
0803xx	චෙක් ගෙවීම් AB 06	7000		22000
1403xx	චෙක් තැන්පතු 218		8700	30700
2003xx	චෙක් ගෙවීම් 07	12400		18300
2203xx	ස්ථාවර නියෝග (බැංකු ණය)	14000		4300
2503xx	ණයගැති ප්‍රේෂණ		8400	12700
2803xx	චෙක් තැන්පත් 425		6000	18700
3003xx	ලාභාංශ		4900	23600
3003xx	හරබදු	800		22800
3103xx	බැංකු ගාස්තු	1200		21600

බැංකු සැසඳුම් ප්‍රකාශයක්

ක්‍රියාකාරකම් 03

ඔබ ඔබගේ මිතුරන් දෙදෙනෙකු සමග එකතු වී පහත සඳහන් ලියවිලි රැස්කර නිරීක්ෂණය කරන්න.

- විවිධ බැංකු කිහිපයක මුදල් හා චෙක්පත් තැන්පත් කිරීමේ පත්‍රිකා
- විවිධ බැංකු නිකුත් කරන චෙක් පත් කිහිපයක්
- විවිධ බැංකු විසින් නිකුත් කරන ලද බැංකු ප්‍රකාශ කිහිපයක්

ද්විත්ව තීරු මුදල් පොතක ගනුදෙනු සටහන් කිරීම

ද්විත්ව තීරු මුදල් පොතක ගනුදෙනු සටහන් කිරීමේ දී යොදා ගන්නා මූලාශ්‍ර ලේඛන පිළිබඳ ව දැනුවත් වීමෙන් පසු මීළඟට ද්විත්ව තීරු මුදල් පොතක ගනුදෙනු සටහන් කිරීමට අදාළ තොරතුරු සාකච්ඡා කරමු.

තැන්පතු

ජංගම ගිණුමක තැන්පත් කළ හැකි දේ විවිධාකාර වේ. ඒවා අතර ප්‍රධාන වන්නේ, මුදල් හා චෙක්පත් ය.

අතැති මුදල් තැන්පත් කිරීමේ දී සිදු වන්නේ කාසි හා නෝට්ටු ලෙස පවතින මුදල් ප්‍රමාණය අඩු වීමත්, බැංකු ජංගම ගිණුමේ ඇති මුදල් ප්‍රමාණය වැඩි වීමත් ය. මේ අනුව 'මුදල්' බැංකුවේ තැන්පත් කිරීමේ දී බැංකු ජංගම ගිණුමේ ඇති මුදල් ප්‍රමාණය වැඩිවන නිසා බැංකු තීරුව හර කරනු ලබයි. අතැති මුදල් ප්‍රමාණය අඩුවන බැවින් මුදල් තීරුව බැර කරනු ලබයි.

මුදල් තීරුව හා බැංකු තීරුව යන දෙක ම වත්කම් ගිණුම් වර්ගයට අයත්වන බැවින් වත්කම් පිළිබඳ ද්විත්ව සටහන් මූලධර්මය අනුව සටහන් තැබීම සිදුවේ. හර හා බැර යන සටහන් දෙක ම මුදල් පොතේ පවතින නිසා සඟල පිටුව තිරුවේ 'ප්‍රති' යන කෙටි යෙදුම ලිවිය යුතු ය. 'ප්‍රති' යනු ප්‍රති සටහන් යන්න ය.

ව්‍යාපාරයට ලැබෙන චෙක්පත් බැංකුවේ තැන්පත් කරන තුරු මුල් වරට සටහන් කිරීම සිදු වන්නේ, මුදල් තීරුවට හර කර අදාළ අනෙක් ගිණුමට බැර කිරීම යි. එලෙස ලැබුණ චෙක්පත් බැංකුවේ තැන්පත් කළ විට බැංකු තීරුව හර කර මුදල් තීරුව බැර කරනු ලබයි. එවිට ප්‍රති සටහනක් ඇති වේ.

චෙක්පත් නිකුත් කිරීම

චෙක්පත් නිකුත් කරන විට ජංගම ගිණුමේ ඇති මුදල් ප්‍රමාණය අඩුවේ. මෙය වත්කම් අඩුවීමට හේතු වන බැවින්, බැංකු තීරුව බැර කෙරේ. හර සටහන අදාළ අනෙක් ගිණුමේ පවතී.

චෙක්පත් අගරුවීම

ජංගම ගිණුමේ මුදල් නොමැති වීම, චෙක්පත අවිධිමත් ව ලියා තිබීම, ආදර්ශ අත්සනට වඩා චෙක්පතෙහි තබා ඇති අත්සන වෙනස් වීම ආදී හේතු මත චෙක්පත් අගරු වීම සිදු වේ. එලෙස අගරුවන චෙක්පත්,

- තැන්පත් කළ චෙක්පත්
- නිකුත් කළ චෙක්පත්, සම්බන්ධයෙන් විය හැකි ය.

ව්‍යාපාරය විසින් තැන්පත් කළ චෙක්පතක් අගරු වූ විට ඒ බව **'අගරු චෙක් නිවේදන ලිපිය'** මගින් ව්‍යාපාරයට දැනුම් දේ.

තැන්පත් කළ චෙක්පතෙහි සඳහන් වටිනාකම දැනටමත් මුදල් පොතේ බැංකු තීරුවට හර කර ඇත. එහෙත් චෙක්පත අගරු වීම නිසා බැංකුවේ ඇති මුදල් වැඩි වී නැත. එබැවින් බැංකු තීරුවට හර කර ඇති වටිනාකම ඉන් ඉවත් කර චෙක්පත ලබාදුන් පාර්ශවය නැවත ණය ගැතියෙකු බවට පත්කළ යුතු ය. චෙක්පතේ අගරු වීම ණය ගැතියාට දැනුම් දෙනතුරු 'අගරු වූ චෙක්පත් ගිණුම' ලෙස තාවකාලික ගිණුමක් විවෘත කිරීම බහුලව සිදුවන්නකි. මේ සඳහා පියවර දෙකක් පසු කළ යුතු වේ. එනම්,

- පළමු පියවර — අගරු වූ, තැන්පත් කළ චෙක්පත ආපසු ලැබුණ විට, අගරු වූ චෙක්පත් ගිණුම හර කර බැංකු තීරුව බැර කළ යුතු ය.
- දෙවන පියවර — අගරු වූ චෙක්පත ණය ගැතියා වෙත යැවූ විට ණයගැති ගිණුම හර කර අගරු වූ චෙක්පත් ගිණුම බැර කළ යුතු ය.

ව්‍යාපාරය විසින් නිකුත් කළ චෙක්පත් ද අගරු විය හැකි ය. එලෙස අගරු වූ චෙක්පත් එම ගනුදෙනුකරු විසින් ආපසු ව්‍යාපාරයට ලබා දේ. චෙක්පත අගරුවීමට කලින් තබා ඇති සටහන ඉවත් කිරීම මෙහි දී සිදු වේ. එවිට බැංකු තීරුව හර කර අදාළ අනෙක් ගිණුම බැර කිරීම අවශ්‍ය වේ.

ව්‍යාපාරයේ ප්‍රයෝජනයට බැංකුවෙන් ආපසු මුදල් ලබා ගැනීම

චෙක්පත් ලියා ව්‍යාපාරයේ ප්‍රයෝජනයට බැංකුවෙන් ආපසු මුදල් ලබා ගන්නා අවස්ථා පවතී. එවිට කාසි හා නෝට්ටුවලින් පවතින අත ඉතිරි මුදල් ප්‍රමාණය වැඩිවන අතර බැංකු ජංගම ගිණුමේ ඇති මුදල් ප්‍රමාණය අඩු වේ. එම තත්ත්වය මුදල් තීරුව හර වීමටත් බැංකු තීරුව බැර වීමටත් හේතු වේ. එනම් ප්‍රති සටහනක් ඇති වේ.

චෙක්පත් මුදල් කරදීම

බාහිර පුද්ගලයින් හෝ ආයතන ඔවුන්ගේ චෙක්පත් මාරු කර ගැනීම සඳහා ව්‍යාපාරයට ලබා දේ. එහි දී කොමිස් මුදලක් ලබාගෙන හෝ කොමිස් මුදලක් ලබා නො ගෙන චෙක්පත සඳහා මුදල් ලබා දේ.

ප්‍රති සටහන්

යම් ගනුදෙනුවක හර හා බැර යන සටහන් දෙකම මුදල් පොතෙහි සටහන් වන විට ඒවා ප්‍රති සටහන් ලෙස හැඳින්වේ. එලෙස ප්‍රති සටහන් ඇතිවන අවස්ථා වන්නේ,

* කාසි හා නෝට්ටු ලෙස පවතින මුදල් බැංකුවේ තැන්පත් කිරීමේ දී
* ලැබී ඇති චෙක්පත් බැංකුවේ තැන්පත් කිරීමේ දී
* ව්‍යාපාරයේ ප්‍රයෝජනයට චෙක්පත් ලියා බැංකුවෙන් මුදල් ආපසු ගැනීමේ දී ය.

ද්විත්ව තීරු මුදල් පොත තුලනය කිරීම

ගිණුම් කාල සීමාව අවසානයේ දී ද්විත්ව තීරු මුදල් පොත තුලනය කර එහි ශේෂ ගණනය කර ගනී. මෙහිදී

* මුදල් තීරුවේ **හර ශේෂයක්** පවතී. එය වත්කමකි.
* බැකු තීරුවේ ශේෂය 'හර' හෝ 'බැර' විය හැකි ය.

  හර ශේෂයක් නම් එහි අදහස ව්‍යාපාරය වෙනුවෙන් බැංකු ජංගම ගිණුමේ මුදල් ඉතිරි ව පවතින බවයි. එය වත්කමකි.

  බැර ශේෂයක් නම් එහි අදහස ව්‍යාපාරය බැංකුවට ණය වී ඇති බවයි. බැංකුවේ අවසරය මත ජංගම ගිණුමේ පැවති මුදල් ප්‍රමාණයට වඩා වැඩි වටිනාකමකින් චෙක්පත් නිකුත් කිරීම ඊට හේතුවයි. **'බැංකු අයිරාව'** ලෙසට හැඳින්වෙන මෙය ව්‍යාපාරයේ වගකීමකි.

ද්විත්ව තීරු මුදල් පොතක ගනුදෙනු සටහන් කෙරෙන අන්දමත්, ගිණුම් කාල සීමාව අවසානයේ දී ශේෂය ගණනය කරන අන්දමත්, පහත සඳහන් නිදසුන මගින් පෙන්නුම් කෙරේ.

නිදසුන : • 20xx0201 දිනට මාධව ගේ ව්‍යාපාරයේ අත ඉතිරි මුදල් ශේෂය රුපියල් 42,000 කි. පෙබරවාරි මාසය තුළ සිදු වූ ගනුදෙනුවල විස්තරයක් පහත දැක්වේ.

දිනය	චෙක් අංක	විස්තරය
2 03		රු. 30,000 කින් ජංගම ගිණුම විවෘත කිරීම.
2 05		අත්පිට විකුණුම් රු. 9,000 කි.
2 08	AB 01	චෙක්පතක් නිකුත් කර විකිණීම සඳහා රු. 12,000ක භාණ්ඩ මිලදී ගැනීම.
2 10	AB 02	ගෙවල් කුලී චෙක්පතකින් ගෙවීම රු. 2,000 කි.
2 12	AB 03	වැටුප් සඳහා රු. 3,000 ක චෙක්පතක් නිකුත් කිරීම.
2 13	AB 03	වැටුප් සඳහා නිකුත් කළ චෙක්පත අගරු වීම.
2 14	-	අගරු වූ වැටුප් සඳහා වූ චෙක්පත වෙනුවට මුදල් ගෙවීම.
2 15	SP 24	භාණ්ඩ විකිණීමෙන් රු. 8,000 ක චෙක්පතක් ලබා ගැනීම.
2 16	SP 24	ලැබුණු චෙක්පත් බැංකුවේ තැන්පත් කිරීම.
2 17	MT 19	කෝසලගෙන් රු. 5,000 ක චෙක්පතක් ලැබීම.
2 18	MT 19	ලැබුණු චෙක්පත බැංකුවේ තැන්පත් කිරීම.
2 20	AB 04	චෙක්පතක් නිකුත් කර ව්‍යාපාරයේ ප්‍රයෝජනයට රු. 7,000ක් බැංකුවෙන් ගැනීම.
2 21	MT 19	කෝසලගෙන් ලැබී බැංකු ගතකළ චෙක්පත අගරු වීම.
2 24	AB 05	ගෙවල් කුලී සඳහා රු. 2,000 ක චෙක්පතක් නිකුත් කිරීම.
2 25	-	අගරු වූ චෙක්පත වෙනුවෙන් කෝසලගෙන් මුදල් ලැබීම.
2 26	-	බැංකුවේ රු. 6,000 ක් තැන්පත් කිරීම.
2 27	CD 45	රහීම් නැමැත්තාට රු. 3,000 ක චෙක්පත මාරු කර දීම.
2 28	CD 45	ලැබී ඇති චෙක්පත බැංකුවේ තැන්පත් කිරීම.

හර මුදල් පොත බැර

දිනය	ල අ	විස්තරය	ස පි	මුදල්	බැංකු	දිනය	ල අ	විස්තරය	ස පි	මුදල්	බැංකු
20xx 02.01		ශේෂය ඉ/ගෙ		42,000		20xx 02.03		බැංකු	ප්‍රති	30,000	
02 03		මුදල්	ප්‍රති		30,000	2 08		ගැණුම් AB 01			12,000
02 05		විකුණුම්		9,000		2 10		ගෙවල්කුලීAB 02			2,000
02 13		වැටුප් (අගරු චෙක්)			3,000	2 12		වැටුප් AB 03			3,000
						2 14		වැටුප්		3,000	
02 15		විකුණුම් (චෙක්)		8,000		2 16		බැංකු	ප්‍රති	8,000	
02 16		මුදල්	ප්‍රති		8,000	2 18		බැංකු	ප්‍රති	5,000	
02 17		කෝසල (චෙක්)		5,000		2 20		මුදල් AB 04	ප්‍රති		7,000
02 18		මුදල්	ප්‍රති		5,000	2 21		අගරු චෙක් (කෝසල)			5,000
02 20		බැංකු	ප්‍රති	7,000							
02 25		කෝසල		5,000		2 24		ගෙවල් කුලී			
02 26		මුදල්	ප්‍රති		6,000			AB 05			2,000
02 27		රහීම් (චෙක්)		3,000		2 26		බැංකු	ප්‍රති	6,000	
02 28		මුදල් CD 45	ප්‍රති		3,000	2 27		රහීම්		3,000	
						2 28		බැංකු CD 45	ප්‍රති	3,000	
								ශේෂය ප/ගෙ		21,000	24,000
				79,000	55,000					79,000	55,000
03 01		ශේෂය ඉ/ගෙ		21,000	24,000						

ක්‍රියාකාරකම් 04

01. පහත සඳහන් මූලාශ්‍ර ලේඛන බිහිවන්නේ කවර අවස්ථාවලදී ද?

i. ලදුපත
ii. ගෙවීම් වවුචරය
iii. පිළිපත
iv. මුදල් තැන්පත් කිරීමේ පත්‍රය
v. චෙක් තැන්පත් කිරීමේ පත්‍රය
vi. බැංකු ප්‍රකාශය

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ක්‍රියාකාරකම් 05

අනුහස් ව්‍යාපාරයේ 20xx.01.01 දිනට පැවති ශේෂයන් පහත දැක්වේ.

මුදල් ශේෂය	38,000
බැංකු ශේෂය (හර)	15,000
ණයගැති	20,000
ණය හිමි	18,000
බැංකු ණය	30,000

ජනවාරි මාසය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

20xx.01.03	අත්පිට ගැණුම් : මුදලින් 16,000, චෙක්පතකින් 14,000
05	ණයගැති ලැබීම් මුදලින් 4,000 චෙක්පතකින් 3,000
07	ලැබුණ චෙක්පත් බැංකුවේ තැන්පත් කිරීම.
10	ණයහිමි ගෙවීම් : මුදලින් 5,000 චෙක්පතකින් 4,000
12	ණය ගැතියන්ගෙන් ලැබුණු චෙක්පත අගරු විය.
15	චෙක්පත අගරු වීම ණය ගැතියාට දැනුම් දීම.
18	අගරු වූ චෙක්පත වෙනුවෙන් ණය ගැතියාගෙන් මුදල් ලැබීම.
20	බැංකු ණයෙන් කොටසක් පියවීම සඳහා රු. 2,000 ක චෙක්පතක් නිකුත් කිරිම.
22	ණය හිමියන්ට නිකුත් කළ රු. 4,000 චෙක්පත අගරු වීම.
23	අගරු වූ චෙක්පත වෙනුවෙන් ණය හිමියාට මුදල් ගෙවීම.
24	ණය ගැතියන්ගෙන් රු. 5,000 ක චෙක්පතක් ලැබීම.
25	මිත්‍රයෙකු වන සංජයගේ රු. 4,000 ක චෙක්පත මාරු කර දීම.
27	ලැබුණු චෙක්පත් සමඟ රු. 2,000 ක් බැංකුවේ තැන්පත් කිරීම.
28	රු. 15,000 චෙක්පතක් නිකුත් කර විකිණීම සඳහා භාණ්ඩ මිළදී ගැනීම.
30	ව්‍යාපාරයේ ප්‍රයෝජනයට රු. 5,000 ක චෙක්පතක් ලියා බැංකුවෙන් මුදල් ගැනීම.

අවශ්‍යවන්නේ,

01. ජනවාරි මාසය සඳහා අනුහස් ව්‍යාපාරයේ මුදල් පොත පිළියෙල කරන්න.
02. 20xx.01.31 දිනට මුදල් පොත තුලනය කර ශේෂයන් ගණනය කරන්න.
03. මුදල් පොතේ ඇතුළත් කළ තොරතුරු ලෙජරයට පිටපත් කරන්න.
04. මුදල් පොත සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති පහත සඳහන් දේ පිළිබඳ ව ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.
    - අ. බැංකු තීරුවේ බැර ශේෂය
    - ආ. මුදල් පොතේ ප්‍රති සටහන්

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

5.3 බැංකු සැසඳුම් ප්‍රකාශය (Bank reconcilation statement)



ව්‍යාපාරය තම මුදල් පොතේ බැංකු තීරුවේ ගනුදෙනු සටහන් කර සාමාන්‍යයෙන් මාසය අවසාන දිනට තුලනය කර ශේෂය ගණනය කර ගනී. වාණිජ බැංකුව ද ජංගම ගිණුමේ ඇතුළත් කර ඇති තොරතුරු සඳහන් කර එම කාල සීමාව වෙනුවෙන් වාර්තාවක් ව්‍යාපාරයට (ජංගම ගිණුම් හිමිකරුට) එවනු ලබයි. එය **බැංකු ප්‍රකාශය** වේ.

ව්‍යාපාරයේ මුදල් පොතේ බැංකු තීරුවේ සඳහන් ශේෂයත් බැංකු ප්‍රකාශයේ සඳහන් ශේෂයත් අතර වෙනසක් පැවතිය හැකි ය. එහිදී ශේෂයන්ගේ වෙනස් වීමට හේතු වූ කරුණු අනාවරණය කර ගැනීම කළ යුතු වේ. ඉන්පසු එම අනාවරණය වූ තොරතුරු මත මුදල් පොතේ බැංකු ශේෂය සංශෝධනය කර බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කළ යුතු ය. එහි අරමුණ බැංකු ශේෂයන්ගේ නිවැරැදිතාවය තහවුරු කර ගැනීම ය.

බැංකු ශේෂයන්ගේ වෙනසට බලපාන හේතු අනාවරණය කර ගැනීමේ දී ව්‍යාපාරයේ මුදල් පොතේ බැංකු තීරුවත් බැංකු ප්‍රකාශයත් අතර සැසඳීම් කළ යුතු වේ. ව්‍යාපාරය තම මුදල් පොතේ බැංකු ගනුදෙනු වාර්තා කර ඇත්තේ වත්කම්වලට අදාළ ද්විත්ව සටහන් මූලධර්මයට අනුකූල ව වේ. එහෙත් වාණිජ බැංකුව ව්‍යාපාරය වෙනුවෙන් පවත්වා ගන්නා ජංගම

ගිණුමේ බැංකු ගනුදෙනු වාර්තා කර ඇත්තේ වගකීම්වලට අදාළ ද්විත්ව සටහන් මූලධර්මයට අනුකූලවයි. එයට හේතුව වනුයේ ගනුදෙනුකරු තැන්පත් කරන මුදල් සහ චෙක්පත් බැංකුවට වගකීමක් වන බැවිනි. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන සැසඳීම් කළ යුතු වේ. ඒ අනුව,

- මුදල් පොතේ බැංකු තීරුවේ හර කරන අයිතම, බැංකුව විසින් ව්‍යාපාරයේ ජංගම ගිණුමට බැර කෙරේ.
- මුදල් පොතේ බැංකු තීරුවේ බැර කරන අයිතම බැංකුව විසින් ව්‍යාපාරයේ ජංගම ගිණුමට හර කෙරේ.

බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේ පියවර

පියවර 01	මුදල් පොතේ අවසාන බැංකු ශේෂය හා බැංකු ප්‍රකාශයේ සඳහන් ව ඇති අවසාන ශේෂය සමාන ව පවතී ද? යන්න බැලීම.
පියවර 02	එම ශේෂයන් අසමාන වේ නම් මුදල් පොතේ හර තීරුව සමග බැංකු ප්‍රකාශයේ බැර තීරුවද මුදල් පොතේ බැර තීරුව සමග බැංකු ප්‍රකාශයේ හර තීරුව ද සසඳා බලා වෙනසට හේතු අනාවරණය කර ගැනීම.
පියවර 03	වෙනසට බලපෑ හේතුවලින් මුදල් පොතේ සටහන් නොවී ඇති දේ තෝරාගෙන මුදල් පොතේ බැංකු ශේෂය සංශෝධනය කර ගැනීම.
පියවර 04	මුදල් පොතේ සංශෝධිත බැංකු ශේෂය යොද ගනිමින් බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම.

ශේෂයන්ගේ වෙනසට බලපා ඇති හේතු

බැංකු ශේෂයන් අතර වෙනසට බලපෑ හැකි හේතු පහත සඳහන් පරිදි වේ.

1. ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ චෙක් පැවතීම.

ව්‍යාපාරය විසින් නිකුත් කළ චෙක්පත්වලින් කොටසක් යම් යම් හේතු මත ඒවා ලබාගත් අය විසින් මාරු කර ගැනීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකරති. කාල සීමාවට අදාළ මුදල් පොතේ බැංකු තීරුවේ මෙම අගයන් සටහන් වීම නිසා ව්‍යාපාරයේ මුදල් පොතේ බැංකු ශේෂයේ වටිනාකම බැංකු ප්‍රකාශයේ ශේෂයට වඩා අඩුවෙන් පෙන්නුම් කෙරේ.

2. උපලබ්ධි නොවූ චෙක්පත්

උපලබ්ධි නොවූ චෙක් යනු ව්‍යාපාරය විසින් බැංකුවේ තැන්පත් කළ ද එම කාල සීමාව තුළ බැංකුව විසින් ව්‍යාපාරයේ ජංගම ගිණුමට එකතු නොකළ චෙක්පත්වල අගය වේ. නිෂ්කාශනය නොවූ චෙක්පත් බැර නොවූ චෙක්පත් යනුවෙන් ද හැඳින් වේ. මුදල් බවට පත් නොවූ මෙම චෙක්පත් ජංගම ගිණුමට එකතු වීමට තව දුරටත් කාලය පවතී. එබැවින් ව්‍යාපාරයේ මුදල් පොතේ බැංකු ශේෂය, බැංකු ප්‍රකාශයේ ශේෂයට වඩා වැඩියෙන් ගණනය වී තිබේ.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

3. වැරදි

ගණනය කිරීමේදීත් ලැබීම් සහ ගෙවීම් සටහන් කිරීමේදීත් ව්‍යාපාරය අතින් හෝ බැංකුව අතින් හෝ සිදු වී ඇති වැරදි තිබීම. එබැවින් ව්‍යාපාරයේ මුදල් පොතේ දැක්වෙන බැංකු ශේෂය වෙනස් විය හැකි ය.

4. බැංකු ගාස්තු පැවතීම

බැංකු ගාස්තු යනු බැංකුව විසින් ජංගම ගිණුමෙන් අඩු කරගෙන ඇති සේවා ගාස්තු, චෙක් පොත් ගාස්තු, තැපැල් ගාස්තු ආදී වටිනාකම් වේ. මේවා බැංකු ප්‍රකාශයේ සඳහන් වුව ද මුදල් පොතේ බැංකු තීරුවේ නොපවතී. එබැවින් ව්‍යාපාරයේ මුදල් පොතේ දැක්වෙන බැංකු ශේෂය වැඩි වටිනාකමකින් පෙන්නුම් කෙරේ.

5. ස්ථාවර නියෝග පැවතීම

ස්ථාවර නියෝග යනු නිශ්චිත දිනක දී කිසියම් පාර්ශවයකට ගෙවීමක් කරන ලෙස දන්වා ව්‍යාපාරය විසින් තම ජංගම ගිණුම පවත්වාගෙන යන බැංකුවට දෙනු ලබන නියෝග වේ. එම නියෝග මත ගෙවනු ලබන ගාස්තු සෑම වාරිකයක් ම එකම වටිනාකමකින් යුත්ක වීම බහුල ව දක්නට ලැබෙන්නකි. බැංකු ණය වාරික, කල්බදු ණය වාරික, රක්ෂණ වාරික, කඩ කුලී ගෙවීම් ඒවාට නිදසුන් වේ. නිත්‍ය නියෝග ලෙසට ද හැඳින්වෙන මේවා ව්‍යාපාරයේ මුදල් පොතේ බැංකු තීරුවේ ඇතුළත් නොවූ විට බැංකු ශේෂය වැඩි වටිනාකමකින් පෙන්නුම් කෙරේ.

6. සෘජු ප්‍රේෂණ පැවතීම

ව්‍යාපාරයේ ජංගම ගිණුමට වෙනත් පාර්ශව විසින් සෘජු ව ම එවනු ලබන චෙක්පත්, බැංකු අණකර ආදිය මීට අයත් ය. ඒවා ණයගැති ප්‍රේෂණ, ලාභාංශ, පොලී ලැබීම්, කඩ කුලී ලැබීම් ආදී ලෙස බැංකු ප්‍රකාශනයේ සඳහන් ව තිබිය හැකි ය. මෙම කරුණ මුදල් පොතේ බැංකු තීරුවේ සටහන් නොවීම මත ව්‍යාපාරයේ මුදල් පොතේ දැක්වෙන බැංකු ශේෂය අඩු වටිනාකමකින් පෙන්නුම් කෙරේ.

මුදල් පොතේ බැංකු ශේෂය සංශෝධනය කිරීම

මුදල් පොතේ බැංකු ශේෂය සංශෝධනය කිරීමේ දී සෘජු ප්‍රේෂණ එකතු කළ යුතු ය. එනම් මුදල් පොතට හර කළ යුතු වේ. ස්ථාවර නියෝග හා බැංකු ගාස්තු අඩුකළ යුතු ය. එනම්, මුදල් පොතට බැර කළ යුතු ය. එවිට මුදල් පොතේ බැංකු ශේෂය සංශෝධනයට ලක් වේ.

උපලබ්ධි නොවු චෙක්පත් හා ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් මුදල් පොත සංශෝධනයේ දී ඊට ඇතුළත් නොකෙරේ. ඊට හේතුව එම වටිනාකම් දැනටමත් මුදල් පොතට ඇතුළත් ව තිබීමයි.

මුදල් පොතේ සංශෝධිත බැංකු ශේෂය යොදා ගනිමින් බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේ දී



නිකුත් කළ නමුත් (එම මාසය තුළ දී) ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත්වල අගය එකතු කළ යුතු වේ. ඊට හේතුව එම චෙක්පත්වලට ගෙවීම් නොකළ නිසා බැංකුවේ පවතින මුදල ව්‍යාපාරයේ මුදල් පොතේ පවතින මුදලට වඩා වැඩි අගයකින් යුත්ත වීමයි.

තැන්පත් කළ නමුත් උපලබ්ධි (නිෂ්කාශනය) නොවූ චෙක්පත්වල අගය අඩු කළ යුතු ය. ඊට හේතුව එම චෙක්පත් තවම බැංකුව විසින් ව්‍යාපාරයේ ජංගම ගිණුමට එකතු නොකිරීම මත ජංගම ගිණුමේ ඇති මුදල අඩු අගයකින් යුක්ත වීමයි.

මෙලෙස ගැළපීම් කළ විට බැංකු ප්‍රකාශයේ සඳහන් ශේෂය ලැබේ.

මීළඟට ව්‍යාපාරයේ මුදල් පොතේ බැංකු තීරුව හා බැංකුව විසින් සපයනු ලැබූ බැංකු ප්‍රකාශය පදනම් කර ගනිමින් බැංකු සැසඳුම් ප්‍රකාශය (බැංකු සැසඳුම් විස්තරය) පිළියෙල කරන ආකාරය නිදසුනකින් පැහැදිලි කර ගනිමු.

නිදසුන : • සඳමාලි ව්‍යාපාරයේ 20xx මාර්තු මාසයේ මුදල් පොතේ බැංකු තීරු පහත දක්වේ.

හර | **මුදල් පොත** | බැර

දිනය	විස්තරය	බැංකු රු.ශ	දිනය	විස්තරය	බැංකු රු.ශ
20xx			20xx	චෙක් නිකුත් කිරීම්	
03 01	ශේෂය ඉ/ගෙ	16,000	03 05	AB 06	7,000
03 06	මුදල් තැන්පතු	13,000	03 12	AB 07	12,400
03 08	චෙක් තැන්පතු CD 218	8,700	03 16	AB 08	15,400
			03 23	AB 09	6,200
03 20	චෙක් තැන්පතු PR 425	6,000	03 31	ශේෂය ප/ගෙ	19,800
03 29	චෙක් තැන්පතු				
	MP 517	7,600			
	SP 420	9,500			
		60,800			60,800
04 01	ශේෂය ඉ/ගෙ	19,800			

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

සඳමාලි ව්‍යාපාරයට බැංකුව විසින් එවනු ලැබූ 20xx මාර්තු මාසය සඳහා වූ බැංකු ප්‍රකාශය පහත දැක්වේ.

මහීෂා සඳමාලි මෙ.වි.
බුද්ධ ජයන්ති පාර
නාඹටුන්න.

BOC
BANK OF CEYLON
නාඹටුන්න ශාඛාව

Account Number 0034 02 39016

Currency

Date	Particulars	Payments	Receipts	Balance
0103xx	ශේෂය ඉ/ගෙ			16000
0303xx	මුදල් තැන්පතු		13000	29000
0803xx	චෙක් ගෙවීම් AB 06	7000		22000
1403xx	චෙක් තැන්පතු 218		8700	30700
2003xx	චෙක් ගෙවීම් 07	12400		18300
2203xx	ස්ථාවර නියෝග (බැංකු ණය)	14000		4300
2503xx	ණයගැති ප්‍රේෂණ		8400	12700
2803xx	චෙක් තැන්පත් 425		6000	18700
3003xx	ලාභාංශ		4900	23600
3003xx	හරබදු	800		22800
3103xx	බැංකු ගාස්තු	1200		21600

All the transactions shown on the statement should be verified and the Bank notified of any discrepancy immediately.
Any query relating to transactions beyond 03 months may be subject to levy of a fee.
Unrealised cheque deposits, if any are included in the Closing balance.

ශේෂයන්ගේ වෙනසට බලපෑ හේතුවලින් මුදල් පොතට පමණක් බලපාන හේතු තෝරාගෙන මුදල් පොතේ බැංකු ශේෂය සංශෝධනය කර ගත යුතු වේ. එලෙස පිළියෙල කළ මුදල් පොතේ සංශෝධිත බැංකු ශේෂය පහත දැක්වේ.

මුදල් පොත

	බැංකු (රු)		බැංකු (රු)
ඉ/ගෙ ශේෂය	19,800	බැංකු ණය (ස්ථාවර නියෝග)	14,000
ණය ගැති (සෘජු ප්‍රේෂණ)	8,400	හර බදු	800
ලාභාංශ	4,900	බැංකු ගාස්තු	1,200
		ප/ගෙ ශේෂය	17,100
	33,100		33,100
ඉ/ගෙ ශේෂය	17,100		

ඉන්පසු මුදල් පොතේ සංශෝධිත බැංකු ශේෂය යොදා ගනිමින් බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කළ යුතු වේ. එවිට බැංකු ප්‍රකාශයේ සඳහන් අවසාන ශේෂය ලැබේ. එය පහත දැක්වේ.

සඳමාලි ව්‍යාපාරය
20xx මාර්තු මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශය

	රු.	රු.
ඉ/ගෙ මුදල් පොතේ සංශෝධිත බැංකු ශේෂය		17,100
එකතු කළා:		
මාරු කිරීම සඳහා බැංකුව වෙත		
ඉදිරිපත් නොකළ චෙක්පත්		
AB 08	15,400	
AB 09	6,200	21,600
		38,700
අඩු කළා : නිෂ්කාශනය නොවූ චෙක්පත්		
MP 517	7,600	
SP 420	9,500	17,100
බැංකු ප්‍රකාශයේ සඳහන් ශේෂය		21,600

ක්‍රියාකාරකම් 06

20xx.01.01 දින ශිවරාජා මහතා රු. 60,000 ක් යොදා ජංගම ගිණුමක් විවෘත කර තම ව්‍යාපාරික කටයුතු පහසු කර ගත්තේ ය. ඔහු විවිධ ගෙවීම් සඳහා වලංගු මුදල් හා චෙක්පත් නිකුත් කර ඇත. ලැබෙන චෙක්පත් හා මුදල් වරින් වර බැංකුවේ තැන්පත් කිරීමටත්, ස්ථාවර නියෝග මත බැංකු ණය වාරිකය ගෙවීමටත් කටයුතු යෙදී ය.

20xx ජනවාරි මාසය වෙනුවෙන් බැංකුවෙන් ලැබී ඇති බැංකු ප්‍රකාශයේ දැක්වෙන 20xx.01.31 දිනට වූ බැර ශේෂය එදිනට මුදල් පොතේ බැංකු ශේෂයට සමාන නොවී ඇති බව සැසඳීමෙන් අනාවරණය විය.

අවශ්‍යවන්නේ,

අ. ඉහත විස්තරයේ දැක්වෙන අන්දමට ව්‍යාපාරයේ මුදල් පොතේ බැංකු තීරුවේ ඇතුළත් කර ඇතැයි සිතිය හැකි ගනුදෙනු දක්වා ඒවාට අදාළ මූලාශ්‍ර ලේඛන ඒ ඉදිරියෙන් ලියන්න.

ආ. බැංකුව විසින් එවන ලද බැංකු ප්‍රකාශනයේ බැර තීරුවේ සඳහන් ව ඇතැයි සිතිය හැකි එකිනෙකට වෙනස් අයිතම කිහිපයක් ලියන්න.

ඈ. එම බැංකු ප්‍රකාශනයේ හර තීරුවේ ඇතුළත් ව ඇතැයි සිතිය හැකි එකිනෙකට වෙනස් අයිතම කිහිපයක් ලියන්න.

ඇ. ඔබේ පිළිතුරු අනුව මුදල් පොතේ බැංකු ශේෂය සංශෝධනය කළ යුතු වන්නේ නම් එම ශේෂය,

- වැඩි වීමට
- අඩු වීමට හේතු වන්නේ කවර දෑ ඇතුළත් කළ විට ද?

ක්‍රියාකාරකම් 07

20xx පෙබරවාරි මාසයේ කාදර් ගේ ව්‍යාපාරයේ මුදල් පොතේ (බැංකු තීරු) ශේෂය රු. 18,500 කි. එම මාසය සඳහා බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශයේ ශේෂය මුදල් පොතේ ශේෂය හා නොගැළපුණි. පසුව වෙනසට හේතු සෙවීමේ දී පහත සඳහන් කරුණු අනාවරණය විය.

අ. පෙබරවාරි මාසයේ දී තැන්පත් කරන ලද නමුත් එම මාසය තුළ දී උපලබ්ධි නොවූ චෙක්පත්.

තරංගගෙන් ලද රු. 2,000 ක චෙක්පත
විශ්වාගෙන් ලද රු. 40,000 ක චෙක්පත

ආ. පෙබරවාරි මාසයේ දී ලියන ලද නමුත් එම මාසය තුළ මාරු කිරීම සඳහා බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත්

චෙක්පත් අංක 185,320 රු. 2,500
චෙක්පත් අක 185,322 රු. 6,000

ඇ. රාජන් සමාගමෙන් ලැබූ රු. 4,500 ක ලාභාංශ බැංකු ගිණුමට බැර වී තිබීම මුදල් පොතේ සටහන් නොවීම.

අවශ්‍යවන්නේ,

i. 20xx පෙබරවාරි මාසයේ මුදල් පොතේ (බැංකු තීරු) ශේෂය සංශෝධනය කිරීම.

ii. 20xx.02.29 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය සකස් කර බැංකු ප්‍රකාශයේ තිබූ ශේෂය දක්වන්න.

[q [